# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී පාලි මණ්ඩපය
# <u>යෝග්‍යතා පරීක්ෂණය - 2024</u>

# <u>අයදුම්පත පිරවීම සඳහා මාර්ගෝපදේශ</u>

**<u>විශ්වවිද්‍යාල ප්‍රවේශය - කලා / එස්පී පාඨමාලාව, අධ්‍යයන වර්ෂය 2023/2024</u>**

**<u>ප්‍රසංග කලා/ජනමාධ්‍ය පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාව (සිංහල මාධ්‍යය)</u>**

**2023 අ.පො.ස. (උසස් පෙළ) ප්‍රතිඵල මත**

## <u>මාර්ගගත අයදුම් පත්‍රය පිරවීමට පෙර පහත සඳහන් උපදෙස් හොඳින් කියවන්න.</u>

1. අයදුම්පත පිරවීම සඳහා හැකි සෑම අවස්ථාවකදීම ඩෙස්ක්ටොප් (desktop) හෝ ලැප්ටොප් (laptop) පරිගණකයක් භාවිතා කරන්න.

2. මාර්ගගත අයදුම්පත පිරවීම සඳහා **<u>gmail ගිණුමක් භාවිතා කළ යුතුය.</u>** මෙම පරීක්ෂණය පැවැත්වීමට නියමිත දිනය සුදුසුකම් ලත් අයදුම්කරුවන් වෙත අයදුම්පත් එවීමේදී භාවිතා කළ විද්‍යුත් තැපැල (email) ඔස්සේ පසුව දැනුම් දෙනු ලැබේ. **<u>එබැවින් පරීක්ෂණය සඳහා අයදුම් කිරීමේදී වලංගු විද්‍යුත් තැපැල (email) ලිපිනයක් භාවිතා කිරීමට සැලකිලිමත් වියයුතුය.</u>**

3. මෙම අයදුම්පත සම්පූර්ණ කිරීමේදී එක් අපේක්ෂකයෙකුට හිමි වන්නේ එක් අවස්ථාවක් පමණක් වන බැවින් විෂයයන් කිපයක් සඳහා අයදුම් කිරීමට අවශ්‍ය වන්නේ නම් අයදුම් කිරීමට අවශ්‍ය සියලුම විෂයයන් එම අවස්ථාවේම අයදුම්පතට ඇතුලත් කල යුතුය. **<u>අයදුම්පත ඉදිරිපත් (submit) කිරීමෙන් පසු වෙනස්කම් සිදුකළ නොහැකි බැවින් සහ නැවත අයදුම්පතක් ඉදිරිපත් කළ නොහැකි බැවින් කරුණාකර සියලු විස්තර හොඳින් කියවා ඉදිරිපත් කිරීමට පෙර නිරවද්‍යතාවය පරීක්ෂා කර බලන්න</u>**.

4. ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් ශ්‍රීපාලි මණ්ඩපයේ **ගිණුම්** අංක **0000719939** දරන ලංකා බැංකුවේ **හොරණ ශාඛාවේ** ගිණුමට බැර කරන ලද මුදල් තැන්පත් පතෙහි (deposit slip) **<u>ඔබගේ නම සහ හැඳුනුම්පත් අංකය පැහැදිලිව සඳහන් කර</u>** ස්කෑන් (scan) පිටපතක් යෝග්‍යතා පරීක්ෂණ ගාස්තු වශයෙන් අයදුම්පත්‍රය සමග උඩුගත (upload) කළ යුතුය. **<u>(ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය (ATM), චෙක්පත්, තැපැල්/ මුදල් ඇනවුම් භාරගනු නොලැබේ.)</u>**

   යෝග්‍යතා පරීක්ෂණ ගාස්තු වශයෙන් එක් විෂය ක්ෂේත්‍රයක් වෙනුවෙන් රු: 2,000/- ක මුදලක් ගෙවිය යුතුය. ඔබ විසින් අයදුම් කරනු ලබන විෂය ක්ෂේත්‍ර සඳහා පහත සඳහන් පරිදි මුදල් ගෙවිය යුතුය.

   - ජනමාධ්‍ය ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව - රු.2000.00
   - ප්‍රසංග කලා ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව

     ප්‍රසංග කලා ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව හැදෑරීමට බලාපොරොත්තු වන සිසුන් පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන් යටතේ යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටිය යුතුය.

| | |
|---|---|
| නැටුම් | - රු.2000.00 |
| සංගීතය | - රු.2000.00 |
| නාට්‍ය හා රංග කලාව | - රු.2000.00 |
| චිත්‍ර හා සැලසුම්කරණය | - රු.2000.00 |
| සිනමා අධ්‍යයනය | - රු.2000.00 |

තම කැමැත්ත පරිදි විෂය ක්ෂේත්‍ර එකකට හෝ කිහිපයකට පෙනී සිටිය හැක.

5. පාසලේ විදුහල්පති, සමාදාන විනිසුරුවරයෙකු හෝ රජයේ විධායක ශ්‍රේණියේ නිලධාරියෙකු විසින් සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද අ.පො.ස. (උ.පෙ.) 2023 ප්‍රතිඵල ලේඛණයේ සහ අ.පො.ස. (සා.පෙ.) විභාග ප්‍රතිඵල ලේඛණයේ (ඉංග්‍රීසි විෂය සමත් සහතිකයේ) ස්කෑන් (scan) පිටපත්. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් මාර්ගගත මාදිලියෙන් ලබා ගත් අ.පො.ස.(උසස් පෙළ) ප්‍රතිඵල ලේඛණ (online results sheets) ද ඉහත පරිදි සහතික කළ යුතුයි.

6. අයදුම්පතෙහි සහ සහතිකපත්‍ර වල සඳහන් නම් අතර වෙනසක් ඇත්නම් එම නම් වලින් හැඳින්වෙන්නේ එකම පුද්ගලයෙකු බවට සහතික කළ දිවුරුම් පෙත්සමක ස්කෑන් කරන ලද පිටපතක් අයදුම්පත්‍රය සමඟ උඩුගත (upload) කළ යුතුය.

7. අයදුම්පත පිරවීම ආරම්භ කිරීමට පෙර අපේක්ෂකයා උඩුගත කළ යුතු පහත සඳහන් ලිපි ලේඛණ (JPG හෝ PDF format) සූදානම් කර ගත යුතුය.
   - බැංකු ගෙවීම් කුවිතාන්සිය - ඔබගේ නම සහ ජාතික හැඳුනුම්පත් අංකය රිසිට් පතෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය.
   - අ.පො.ස.(සාමාන්‍ය පෙළ) ඉංග්‍රීසි සමත් සහතිකය
   - අ.පො.ස.(උසස් පෙළ) 2023 සහතිකය
   - ඔබගේ ජාතික හැඳුනුම්පතෙහි දෙපසෙහිම පැහැදිලි ඡායාරූප

8. උඩුගත කළ යුතු ලිපිගොනු පහත සඳහන් පරිදි නම් කළ යුතුය. සෑම ගොනුවක්ම අපේක්ෂකයාගේ ජාතික හැඳුනුම්පත් අංකයෙන් ආරම්භ කළ යුතුය.
   උදා:-
   - අ.පො.ස.(උසස් පෙළ) නම් "272222386V_AL" ලෙස
   - අ.පො.ස.(සාමාන්‍ය පෙළ) නම් "272222386V_OL" ලෙස
   - ජාතික හැඳුනුම්පත ඉදිරිපස නම් "272222386V_IDfront" ලෙස
   - ජාතික හැඳුනුම්පත පිටුපස නම් "272222386V_IDrear" ලෙස
   - දිවුරුම් ප්‍රකාශය නම් "272222386V_Affidavit" ලෙස **(නමෙහි වෙනසක් ඇත්නම් පමණක්)**
   - බැංකු ගෙවීම් කුවිතාන්සිය නම් "272222386V_slip" ලෙස

9. යෝග්‍යතා පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා මෙම පරීක්ෂණය ශ්‍රී පාලි මණ්ඩප පරිශ්‍රයේදී <u>අගෝස්තු මස අවසන් සතියේ සිට පැවැත්වීමට නියමිතය.</u> **<u>විභාග ප්‍රවේශ පත්‍රය ලබා ගැනීමට උපදෙස් ඔබගේ විද්‍යුත් ලිපිනය (email address), සහ වෙබ් අඩවිය මගින් දැනුවත් කරනු ලැබේ. නිවැරදිව සම්පූර්ණ කරන ලද විභාග ප්‍රවේශ පත්‍රයේ මුද්‍රිත පිටපතක් විභාගය සඳහා ඉදිරිපත් කිරීමට ඔබ ළඟ තබා ගත යුතුය.</u>**

10. ගෙවන ලද යෝග්‍යතා පරීක්ෂණ ගාස්තු කුමන හේතුවක් නිසාවත් නැවත ආපසු ගෙවනු නොලැබේ.

11 පහත දක්වා ඇති කරුණු මත ඔබේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප විය හැකිය.

   - මාර්ගගත අයදුම්පත්‍රය අසම්පූර්ණ වීම (මාර්ගගත අයදුම්පත අදාල උපදෙස් අනුව නිවැරදි පරිදි සම්පූර්ණ කර නොතිබීම/අදාල සහතිකපත්/ නිවැරදි පරිදි මුදල් ගෙවන ලද රිසිට්පත ආදිය)

   - විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අපේක්ෂිත අවම ප්‍රවේශ අවශ්‍යතා සපුරා නොතිබීම හා යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටීමට අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබීම.

12. **<u>යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටින සියලුම සිසුන්, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අයදුම්පත් කැඳවීමේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ද අයදුම් කළ යුතුය.</u>**

13. <u>අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය</u>

මාර්ගගතව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය (Online Application) අදාල ලියකියවිලි සමග **<u>2024.08.07 දින ප.ව. 11.59 ට හෝ එදිනට පෙර</u>** යොමු කළ යුතුය. මෙම දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

14. අයදුම්පත පිරවීම සම්බන්ධයෙන් හෝ යෝග්‍යතා පරීක්ෂණය සම්බන්ධයෙන් කිසියම් ගැටළුවක් පවතීනම් aptitude@spc.cmb.ac.lk යන විද්‍යුත් ලිපිනයට යොමු කිරීමෙන් හෝ 034-2212919 යන දුරකථන අංකය මගින් විමසන්න.

ශ්‍රී පාලි මණ්ඩපය
කොළඹ විශ්වවිද්‍යාලය
වැවල, හොරණ.
2024.07.19